# සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතිය

# අයදුම්පත් කැඳවීම

සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 02/2019 චක්‍ර ලේඛන අනුව සුදුසුකම් සපුරන ලද මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියලුම අයදුම්පත් 2020-09- 25 දින හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් තනතුරු නාමය සඳහන් කර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කර **"ගරු සභාපති, සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතිය, රිකිල්ලගස්කඩ"** යන ලිපිනයට එවිය යුතුය.

සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය සමග අදාළ සහතික වල ඡායා පිටපත් එවිය යුතු අතර, එසේ පිටපත් නොමැතිව සුදුසුකම් සනාථ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අදාළ සහතිකවල ඡායා පිටපත් සමග මෑතකදී ගත් චරිත සහතික දෙකක් සහ පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකයද, වයස තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයේ පිටපතක් සහ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්ද එවිය යුතුය.

දැනටමත් සමුපකාර සමිතියක සේවයේ නියුතු අයෙක් තම සමිතිය මගින් ඉල්ලුම්පත් යොමු කළ යුතු අතර සමුපකාර සේවකයන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

1. S.U.M.L - **01:01 සාමානකාධිකාරී** II & I

➢ වැටුප් පරිමාණ අංකය - S.U.M.L- 01:01

➢ වැටුප් පරිමාණය - 25,400 - 500X10- 600X10 - 750X10 = 43,900/-

➢ වයස් සීමාව - 18 - 45

➢ සුදුසුකම් -

අ. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් (රාජ්‍ය පරිපාලනය / කළමනාකරණය / වාණිජ / ව්‍යාපාර පරිපාලනය / ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයක උපාධියක් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

හෝ

ආ. උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාව

හෝ

ඇ. මාස 09 ක් හෝ ඊට වැඩි අධ්‍යයන කාලයක් ඇති ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව / මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව / මාස 06 ක් හෝ ඊට වැඩි අධ්‍යයන කාලයක් ඇති සමුපකාර සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳව ඩිප්ලෝමාව සමග ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ S.E.M.L - 02:01 වැ.ප සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරෙහි වසර 03 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම හෝ S.E.M.L - 02:03 වැ.ප. සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) තනතුරෙහි වසර 03 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

ඇ. මාස 09 ක් හෝ ඊට වැඩි අධ්‍යයන කාලයක් ඇති ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව / මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව / මාස 06 ක් හෝ ඊට වැඩි අධ්‍යයන කාලයක් ඇති සමුපකාර සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳව ඩිප්ලෝමාව සමග S.E.M.L - 02:02 වැ.ප. සහකාර සාමාන්‍යාධිකාරී (වාණිජ) තනතුරෙහි වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම හෝ S.E.M.L - 02:04 වැ.ප. සහකාර සාමාන්‍යාධිකාරී (පිරිස්) තනතුරෙහි වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**ගරු සභාපති,**
**සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතිය,**
**රිකිල්ලගස්කඩ.**